# POLITICAL IDEOLOGIES
# (Part II)

# සමාජවාදය

19 වැනි සියවසේ යුරෝපයේ මතු වූ දේශපාලන මතවාදයකි.

මෙය බිහි වීමට පදනම් වූයේ 17 සියවසේ සිට වර්ධනය වූ කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපීය ධනවාදී සමාජයේ ඇති වූ තියුණු පන්ති විභේදනයත්, කම්කරු පන්තිය පත් ව සිටි අතිශය දරිද්‍රතාවත් ය.

අඩු වැටුප්-සමඟ වූ දැඩි ශ්‍රම සූරා කෑමට ගොදුරු වූ කම්කරු පන්තියේ අයිතිවාසිකම් දිනා ගැනීම අරමුණු කරගත් වෘත්තීය සමිති ව්‍යාපාරය හා අරගලය ද 19 සියවසේ මුල් භාගයේ වර්ධනය වී තිබිණ.

ClassWork.LK

සමාජවාදය යන අදහස මතු වන අවධි දෙකක් හඳුනා ගත හැකි වේ.

I. මේ අදහස පළමුවෙන් ම මතු වූයේ ධනවාදී ක්‍රමය යටතේ පැවති පෞද්ගලික දේපළ ක්‍රමය වෙනුවට පොදුවේ සමාජය සන්තක ව පවතින දේපළ ක්‍රමයක් පිළිබඳ විකල්පයක් ඉදිරිපත් කිරීමෙනි. ''දේපළ පිළිබඳ සමාජයේ පොදු අයිතිය'' ඇති කිරීම මඟින් ආර්ථික නිෂ්පාදන ක්‍රියවලිය ද සමාජයේ පොදු ක්‍රියාවලියක් බවට පත් කළ විට පෞද්ගලික දේපළ ක්‍රමය යටතේ මතු වී තිබුණු ඉතා දැඩි ආර්ථික සහ සමාජ අසමානතා අහෝසි කළ හැකි ය යන අදහස මෙහි ආරම්භක සංකල්පගත කිරීමෙන් අපේක්ෂා කෙරිණ.

II. කාල් මාක්ස් හා ෆෙඩ්රික් ඒංගල්ස් යන දෙදෙනා හවුලේ ගොඩනඟා ඉදිරිපත් කළ සමාජවාදය පිළිබඳ අළුත් මතවාදය 'මාක්ස්වාදය' ලෙස හැඳින්වේ. තමන්ගේ අලුත් න්‍යායය, සමාජවාදය පිළිබඳ පැරණි සංකල්පයෙන් වෙනස් කොට දැක්වීමට ''විද්‍යාත්මක සමාජවාදය'' යනුවෙන් ඔවුහු එය හැඳින්වූහ. එය මාක්ස්වාදී සමාජවාදය යනුවෙන් ද හැඳින්විය හැකි ය.

ClassWork.LK

1848 දී මාක්ස් හා ඒංගල්ස් පළ කළ ''කොමියුනිස්ට් ප්‍රකාශය'' මගින් ''සමාජවාදය'' පිළිබඳ මාක්ස්වාදී න්‍යායය පළමුවෙන් ක්‍රමානුකූල ව ඉදිරිපත් කරන ලදි. එහි වූ ප්‍රධාන අදහස් කිහිපයක් සාරාංශ කර දැක්විය හැකි ය.

I. ධනවාදී සමාජ-ආර්ථික ක්‍රමය කම්කරු පන්තියේ ශ්‍රම සූරාකෑම මත ගොඩ නැගී තිබෙන සහ පවතින එකකි.

II. පෞද්ගලික දේපළ ක්‍රමය සහ නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතිය මත පදනම් වූ ධනවාදී ක්‍රමය පවත්නා තාක් ශ්‍රම සූරාකෑම සහ සමාජ අසමානතා පවතී.

III. මෙම ශ්‍රම සූරාකෑම, දරිද්‍රතාව හා සමාජ අසමානතා අහෝසි කිරීමට නම්, ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය අහෝසි කර ඒ වෙනුවට සමාජවාදී සමාජ-ආර්ථික ක්‍රමයක් අලුතෙන් පිහිටුවිය යුතු ය.

ClassWork.LK

IV. එම සමාජ ක්‍රමයේ ප්‍රධාන ම ලක්ෂණය විය යුත්තේ දේපළ සහ ආර්ථික නිෂ්පාදන මාර්ගවල පෞද්ගලික අයිතිය අහෝසි කොට, ඒවායේ පොදු සමාජමය අයිතිය ගොඩ නැගීම ය. එවිට ආර්ථික සම්පත්වල හිමිකරුවන් වන්නේ මුළු මහත් සමාජය යි. වරප්‍රසාද ලාභී ටික දෙනෙක් නොවේ. එවිට සමාජ සම්පත්වලින් නිපදවන දේ සෑම කෙනෙකුට ම සමානව භුක්ති විඳිය හැකි ය. නිෂ්පාදනය, හුවමාරුව සහ පරිභෝජනය සමානත්වය මත ගොඩනැගෙනු ඇත. මෙහි දී සමාජය පන්තිවලට බෙදී යාම ද (පන්ති විභේදනය) තවදුරටත් නොපවතිනු ඇත.

V. මෙවැනි සමාජ-ආර්ථික පරිවර්තනයක් සිදු වන්නට නම් එය සමාජ විප්ලවයක් මාධ්‍ය කොට ගෙන සාක්ෂාත් කරගත යුතු වේ. එහි නායකත්වය ඉටු කරන්නේ කම්කරු පන්තියයි. කම්කරු පන්තියේ නායකත්වයෙන් සිදුවන ''සමාජවාදී විප්ලවය'' ධනවාදී සමාජයේ කම්කරු පන්තිය සහ ධනේශ්වර පන්තිය අතර සිදුවන පන්ති අරගලය කූටප්‍රාප්ත වන සිදුවීම් ද වෙයි.

ClassWork.LK

VI. සමාජවාදී විප්ලවය, රැඩිකල් දේශපාලන පරිවර්තනයකි. එහිදී සිදුවන්නේ ධනවාදී රාජ්‍යය පෙරළා දමා කම්කරු පන්තිය විසින් රාජ්‍ය බලය අත්පත් කරගනු ලැබීම යි. එමඟින් ධනේශ්වර පන්තියේ දේශපාලන බලය අහෝසි වෙයි.

VII. සමාජවාදී රාජ්‍යයේ ප්‍රධාන ම කාර්යය වන්නේ ධනේශ්වර ආර්ථික ක්‍රමය, වෙනුවට දේපළ පිළිබඳ පොදු අයිතිය මත පදනම් වූ සමාජවාදී ආර්ථික හා සමාජ ක්‍රමයක් පිහිටුවීමට අවශ්‍ය රැඩිකල් පරිවර්තනවලට නායකත්වය දීම යි.

VIII. සමාජවාදී සමාජය අවසානයේ දී ''කොමියුනිස්ට්'' සමාජ ක්‍රමයක් බවට පරිවර්තනය වනු ඇත. කොමියුනිස්ට් සමාජ ක්‍රමය මුළුමනින් ම සාමූහිකත්වය හා සමානත්වය මත පදනම් වූ සමාජවාදී පරිවර්තනයේ අවසාන ප්‍රතිඵලය යි.

Class Work.LK

මේ ලක්ෂණ අනුව පැහැදිලි වන කරුණක් නම් එය ලිබරල්වාදය මෙන් ම සමාජ-ආර්ථික-දේශපාලන ව්‍යුහයන් යළි සකස් කිරීම අරමුණු කරගත් මතවාදයක් වූ බව ය. එහෙත් ලිබරල්වාදය ධනවාදයේ මතවාදය යි. සමාජවාදය ධනවාදය නිෂේධ කිරීමේ මතවාදය යි.

විසි වැනි සියවසේ දී සමාජවාදය, දේශපාලන දෘෂ්ටියක් බවට පත් විය. ඒ වෙතින් මතු වූ ධනවාදය පිළිබඳ දැඩි විවේචනයත්, විකල්පයක්-යුරෝපයේ ද, යටත්විජිත ලෝකයේ ද මහත් ආකර්ෂණයට ලක් විය.

නිද :-

1917 රුසියානු විප්ලය, 1949 චීන විප්ලවය, දෙවැනි ලෝක යුද්ධයෙන් පසු නැගෙනහිර යුරෝපයේ සමාජවාදී ආණ්ඩු පිහිටුවීම, 1959 කියුබානු විප්ලවය, යුරෝපයේ කම්කරු පන්ති අරගල, සමාජවාදී මතවාදයෙන් පසු ආභාසය ලැබූ ඒවා ය.

Class Work.LK

20 සියවසේ දී ''ලෝක සමාජවාදී ව්‍යාපාරය'' නම් වූ දේශපාලන ක්‍රියාමාර්ග හා ප්‍රයත්න වර්ධනයද සිදු විය.

මෙකල දේශපාලන මතවාදයක් හැටියට සමාජවාදය තවත් පරිවර්තනයකට භාජනය වේ. එය නම් මාකස්වාදයෙ ඉගැන්වූ ''විපල්වවාදී සමාජවාදයට'' (Revolutionary Socialism) සමානත්රව ''තුන්වැනි ලෝකයේ සමාජවාදය'' (Third-World Socialism) යන මතවාදය ගොඩ නැඟීම යි.

ඉන්දියාවේ ශ්‍රී නේරු, ඊජිප්තුවේ අබ්දුල් ගමාල් නසාර් සහ ටැන්සානියාවේ ජුලියස් නියරේරේ මෙහි ප්‍රධාන ප්‍රකාශකයෝ ය.

තුන්වැනි ලෝක සමාජවාදය ගොඩ නැගෙන්නේ මාක්ස්වාදී-සමාජවාදී න්‍යායයේ තිබූ සමානාත්මතාවය සහ සමාජ සාධාරණාත්වය පිළිබඳ අදහස් මතය.

Class Work.LK

යටත් විජිත කාලයේ, ලිබරල් ධනවාදයෙන් තම රටවල් උරුම කරගත් ආර්ථික උගන සංවර්ධනය හා සමාජ අසමානතාවන්ට පිළියම් නොලැබෙන බව පිළිගත් මේ නායකයෝ පශ්චාත් - යටත්විජිත සමාජවලට වඩාත් ගැළපෙන ආර්ථික සංවර්ධන විකල්ප සෙවූහ. ධනවාදයේත්, සමාජවාදයේත් මූලධර්ම මිශ්‍ර කරගත් මේ විකල්ප හඳුන්වනු ලැබුවේ ''සමාජවාදය'' නමිනි.

ClassWork.LK

ClassWork.LK